සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 11 - 2023

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

උපදෙස් :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (×) ලකුණ යොදන්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

පොල්පිති ගම සණස සංගමයේ අනුග්‍රහය ඇතිව තක්සලා මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය, විදුහල්පතිතුමා, ගුරුවරු හා සිසුන් එක්ව ලේ දන් දීමේ වැඩ සටහනක් පවත්වන ලදී. ඒ සඳහා සී/ස මිල්කා සමාගම විසින් කිරි වීදුරුවක් ලේ පරිත්‍යාගශීලීන් වෙත පරිත්‍යාග කරන ලදී. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මගින් මෙම කාර්ය අධීක්ෂණය කරන ලදී.

01. තක්සලා මහා විද්‍යාලය මගින් සපුරාලන අවශ්‍යතා වන්නේ,
(1) ආහාර (2) අධ්‍යාපනය (3) සෞඛ්‍ය (4) ආරක්ෂාව

02. තක්සලා මහා විද්‍යාලය කෙරෙහි බලපෑම් කරන බාහිර පරිසරයට අයත් සාධකයක් වන්නේ,
(1) සිසුන් (2) ගුරුවරුන් (3) විදුහල්පතිතුමා (4) ආදිශිෂ්‍ය සංගමය

03. පොල්පිතිගම සණස අයත් වන ව්‍යාපාර සංගවිධාන වර්ගය වන්නේ,
(1) සමුපකාරයකි. (2) රාජ්‍ය සංස්ථාවකි.
(3) සමාගම් ය. (4) රාජ්‍ය දෙපාර්තමේන්තුවකි.

04. ඉහත සඳහන් සිද්ධියේ සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) පොල්පිතිගම සණස රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයකි.
(2) සී/ස මිල්කා සමාගම ලාභ අරමුණු කර නොගත් සංවිධානයකි.
(3) කිරි භූමියට අයත් නිෂ්පාදන සාධකයකි.
(4) තක්සලා මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය සමාජ සුභ සාධනය අරමුණු කරගත් ව්‍යාපාර සංවිධානයකි.

05. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සම්බන්ධව වැරදි ප්‍රකාශය වන්නේ,
(1) අඛණ්ඩ පැවැත්මක් ඇත. (2) අරමුදල් රජය මගින් සපයයි.
(3) රජයේ මූල්‍ය නිති සංග්‍රහය අදාල නොවේ. (4) අයිතිය හා පාලනය රජය සතු වීම.

06. නෛතික පුද්ගලභාවයක් සහිත කොටස් නිකුත් කරමින් ප්‍රාග්ධනය සපයාගත හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය වනුයේ,
(1) සංස්ථාපිත සමාගම් (2) රාජ්‍ය සංස්ථා
(3) සමුපකාර සමිති (4) හවුල් ව්‍යාපාර

07. වගකීම අසීමිත නෛතික පුද්ගලභාවයක් හිමි නොවන ව්‍යාපාර සංවිධාන යුගල වන්නේ,
(1) සමූපකාර සමිති හා තනි පුද්ගල ව්‍යාපාර (2) සංස්ථාපිත සමාගම් හා හවුල් ව්‍යාපාර
(3) හවුල් ව්‍යාපාර හා රාජ්‍ය සංස්ථා (4) හවුල් ව්‍යාපාර හා තනි පුද්ගල ව්‍යාපාර

08. පාරිභෝගිකයාට සමීප වීම,
(1) තොග වෙළෙඳාමේ ලක්ෂණයකි. (2) ආනයන වෙළඳාමේ ලක්ෂණයකි.
(3) සිල්ලර වෙළඳාමේ ලක්ෂණයකි. (4) අපනයන වෙළඳාමේ ලක්ෂණයකි.

09. නිශ්චිත කාලසීමාවක් සඳහා යම් නිශ්චිත මුදලක් ස්ථාවර පොලී ප්‍රතිශතයක් යටතේ තැන්පත් කර ආරම්භ කළ හැකි තැන්පතු ගිණුමේ වන්නේ,

(1) ජංගම ගිණුම් (2) ස්ථාවර තැන්පතු ගිණුම්

(3) ඉතිරි කිරීමේ ගිණුම් (4) ධනයෝජන ඉතිරි කිරීමේ ගිණුම්

10. රවිඳුට රු. 50 000 ක ලංකා බැංකුවේ රේඛිත චෙක්පතක් ගයාන්ගෙන් ලැබුණි. රවිඳුට තම මහජන බැංකුවේ ජංගම ගිණුමේ එය තැනපත් කිරීමට නොහැකි විය. මෙහි සඳහන්ව තිබූ රේඛනය වන්නේ,

(1) ගනුදෙනු කළ නොහැකිය. (2) ලංකා බැංකුව.

(3) මහජන බැංකුව. (4) ආදායකයාගේ ගිණුමට පමණි.

11. විදේශීය වෙළඳාම සඳහා උපකාරී වන රක්ෂණ ඔප්පු වර්ගයක් නොවන්නේ,

(1) මුහුදු උවදුරු රක්ෂණ ඔප්පු. (2) අපනයන ණය රක්ෂණ ඔප්පු.

(3) රථවාහන රක්ෂණ ඔප්පු. (4) ස්වාභාවික විපත් රක්ෂණ ඔප්පු.

12. සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධකයක් වන්නේ,

(1) බලය (2) පර්යන්තය (3) මාර්ගය (4) පිරිවැය

13. පහත X තීරුවේ සන්නිවේදන මාධ්‍ය ද Y තීරුවේ සන්නිවේදන මාධ්‍ය සඳහා නිදසුන් ද දක්වයි.

X	Y
(1) වාචික	A දුම්රිය හරස් මාර්ගවලට නවතම විදුලි සංඥාසවි කිරීම.
(2) ලිඛිත	B අ.පො.ස. (ස.පෙළ) සිසුන්ට වාණිජ විෂයට සමන්ත්‍රණයක් පැවැත්වීම.
(3) විද්‍යුත්	C ඩෙංගු මර්ධනය සඳහා අත්පත්‍රිකා මුද්‍රණය කිරීම.
(4) සංකේත හා සංඥා	D මාර්ග අනතුරු පිළිබඳ ඩිජිටල් පුවරු සවිකිරීම.

ඉහත සන්නිවේදන මාධ්‍ය නිදසුන් සමග පිළිවෙලින් ගැලපූ විට පිළිතුර,

(1) BACD (2) BCAD (3) ABCD (4) DABC

14. පාසලේ පැවැත්වෙන වාණිජ දිනය සඳහා තේමාවක් තීරණය කිරීම.

(1) සංවිධානකරණය. (2) පාලනය.

(3) සැලසුම්කරණය. (4) මෙහෙයවීම.

15. මිනිසුන් තම විනෝදය අවශ්‍යතාව සපුරා ගැනීමට චිත්‍රපට නැරඹීමට පුරුදුව සිටී. මෙහි දැක්වෙන චිත්‍රපටි අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය වන්නේ,

(1) ප්‍රවර්ධනය (2) මිල (3) නිෂ්පාදිතය (4) ස්ථානය

16. අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් අතුරෙන් ව්‍යාපාරයකට ආදායම් ලබාදෙන එකම විචල්‍ය වන්නේ,

(1) මිල (2) නිෂ්පාදිතය (3) ප්‍රවර්ධනය (4) ස්ථානය

17. ගිණුම්කරණය යන්න වඩාත් හොඳින් පැහැදිලි කරන ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?

(1) ව්‍යාපාරයේ ආදායම් සහ වියදම් ගණනය කිරීම ගිණුම්කරණයයි.

(2) ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති ප්‍රාර්ශවයකට තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය ගිණුම්කරණයයි.

(3) ව්‍යාපාරයේ සිදුවන ගනුදෙනු සටහන් කිරීම සහ වාර්තා කිරීම ගිණුම්කරණයයි.

(4) ව්‍යාපාරවල නෛතික අවශ්‍යතා ඉටු කිරීම ගිණුම්කරණයයි.

- අමල් විසින් 2023/01/01 දින රු. 500 000 ක් මුදලින් යොදවා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එදිනම රු. 100 000 ක බැංකු ණයක් ගන්නා ලදී.

18. 2023/01/01 දින අමල්ගේ ව්‍යාපාරයේ දක්නට ඇති නිවැරදි ගිණුම්කරණ සමීකරණය වනුයේ,

	වත්කම්	=	වගකීම්	+	හිමිකම්
(1)	600 000	=	100 000	+	500 000
(2)	500 000	=	100 000	+	500 000
(3)	600 000	=	500 000	+	100 000
(4)	500 000	=	-	+	500 000

19. 2023/01/ මාසය තුළ ඉහත අමල්ගේ ව්‍යාපාරය ඉපයූ ශුද්ධ ලාභය රු. 80 000 ් නම් ජනවාරි 31 දිනට ව්‍යාපාරයේ හිමිකම වනුයේ,

(1) 600 000 (2) 580 000 (3) 500 000 (4) 100 000

20. ව්‍යාපාරයක වත්කම් ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් ලෙස වර්ග කල හැක. පහත වත්කම් අතර ජංගම වත්කම් පමණක් දක්නට ඇත්තේ කුමන කාණ්ඩයේ ද?

A - ගොඩනැගිලි B - මුදල් C - ණය ගැතියෝ D - මෝටර් රථ

(1) AB හා C (2) B,C හා D (3) B හා C (4) AB හා D

21. ව්‍යාපාරයේ අයිතිකරු විසින් රු. 50 000 ක් වටිනා යන්ත්‍රයක් ව්‍යාපාරයට යොදවන ලදී. ඉහත ගනුදෙනුවට අදාල ද්විත්ව බලපෑම වනුයේ,

(1) වත්කමක් අඩුවේ වත්කමක් වැඩි වේ. (2) වත්කමක් වැඩි වේ. වගකීමක් වැඩි වේ.

(3) වත්කමක් වැඩි වේ. හිමිකම වැඩිවේ. (4) වත්කම අඩුවේ. හිමිකම අඩුවේ.

22. නදුන්ගේ ව්‍යාපාරයේ 2023/01/08 දින ගොඩනැගිලි කුලී ලෙස රු. 17 000 ක් ගෙවන ලදී. ඉහත ගනුදෙනුවට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) මුදල් පොත හර 17 000
ගොඩනැගිලි කුලී ගිණුම 17 000

(2) ගොඩනැගිලි කුලී ගිණුම හර 17 000
වියදම් ගිණුම බැර 17 000

(3) ගොඩනැගිලි කුලී ගිනුම හර 17 000
උපචිත ගොඩනැගිලි කුලී ගිණුම බැර 17 000

(4) ගොඩනැගිලි කුලී ගිණුම හර17 000
මුදල් ගිණුම බැර 17 000

23. ලංකා ව්‍යාපාරය විසින් 2023/01/02 දින රු. 10 000 ක භාණ්ඩ අමල් ව්‍යාපාරයෙන් ණයට ගන්නා ලදී. ඉහත ගනුදෙනුවට අදාල මූලික පොත හා මූලාශ්‍ර ලේඛණය පිළිවෙලින් දැක් වෙන්නේ,

(1) ගැනුම් ජ'නලය හා ගැනුම් ඉන්වොයිසිය. (2) ගැනුම් ඉන්වොයිසිය හා ගැනුම් ජ'නලරය

(3) මුදල් පොත හා ගැනුම් ජ'ර්නලය. (4) ගැනුම් ජ'නලය හා මුදල් පොත.

24. ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු අතරින් පොදු ජ'නලය තුල සටහන් කරන ලබන ගනුදෙනුවක් වන්නේ,

(1) ස්ථාවර වත්කම් අත්පිට මුදලට විකිණීම. (2) වෙළඳ භාණ්ඩ ණයට ගැනීම.

(3) භාණ්ඩ ණයට විකිණීම. (4) මෝටර් රථ ණයට විකිණීම.

25. 2023 ජනවාරි 31 දිනට සුළු මුදල් භාරකරු සතු මුදල රු. 410 කි. පෙබරවාරි මස මුලදී ප්‍රධාන මුදල් භාරකරු සුළු මුදල් භාරකරුට රු. 1590 ක මුදලක් ලබා දී ඇත. මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණ ද?

(1) රු. 1180 (2) රු. 3000 (3) රු. 2000 (4) රු. 1590

26. ඉහත 25 වන ප්‍රශ්නයෙහි ඇති ව්‍යාපාරයේ අග්‍රිමය රු. 500 කින් වැඩි කරේ නම් මාර්තු මස එම ව්‍යාපාරයේ අග්‍රිමයේ වටිනකම කොපමණ ද?

(1) රු. 1680 (2) රු. 2090 (3) රු. 3500 (4) රු. 2 500

27. පොදු ජ'නලයෙහි ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය වන්නේ,

(1) ජ'නල් වවුචරය (2) පිළිපත (3) ගැනුම් ඉන්වොයිසිය. (4) විකුණුම් ඉන්වොයිසිය.

28. පහත තොරතුරු භාවිතා කර ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ගණනය කර නිවැරදි පිළිතුර තෝරන්න.

- ආරම්භක හිමිකම රු. 100 000 කි.
- අවසාන හිමිකම රු. 240 000 කි.
- කාලච්ඡේදයේ ගැනිලි රු. 100 000 කි.
- කාලච්ඡේදයේ අමතර ප්‍රාග්ධනය රු. 50 000 කි.

(1) රු. 90 000 (2) රු. 190 000 (3) රු. 290 000 (4) රු. 390 000

29. බැංකු ගිණුම් විස්තරයේ හර තීරුවේ දැක්වෙන අයිතමයක් වන්නේ,

(1) ලාභාංශ (2) අයිරා පොලී (3) පොලී ලැබීම් (4) ණයගැති ප්‍රේෂණ

30. පහත සඳහන් ගනුදෙනු වලින් විකුණුම් ජ'නලයේ සටහන් කරන ගනුදෙනුව වනුයේ,

(1) වෙළඳ භාණ්ඩ අත්පිට විකුණුම්

(4) ණයට විකුණන සියලු වත්කම්

(3) නැවත විකිණීමේ අරමුණින් මිලදී ගන්නා වෙළඳ භාණ්ඩ ණයට ගැනුම්.

(4) නැවත විකිණීමේ අරමුණින් මිලදී ගන්නා වෙළඳ භාණ්ඩ ණයට වකුණුම්.

31. රු. 500 ක සුළු මුදල් ශේෂයක් ශේෂ පිරික්ෂුමට නොගැනීමේ වරද නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වනුයේ,

(1) සුළු මුදල් පොත හර රු. 500
ශේෂ පිරික්සුම බැර රු. 500

(2)සුළු මුදල් පොත හර රු. 500
මුදල් පොත බැර රු. 500

(3) සුළු මුදල් පොත හර රු. 500
අවිනිශ්චිත ගිණුම බැර රු. 500

(4)අවිනිශ්චිත ගිණුම බැර රු. 500

32. ණයගැතියෙකුගෙන් ලද චෙක්පතක් අගරු වීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) ණයගැති ගිණුම හර
බැංකු ගිණුම බැර

(2) බැංකු ගිණුම බැර
බැංකු ගිණුම බැර

(3) බැංකු ගිණුම හර
ණයගැති ගිණුම බැර

(4) ණයගැති ගිණුම හර
මුදල් පොත බැර

33. ආධුනික ගිණුම් ලිපිකරුවෙකු විසින් පහත ප්‍රකාශ සිදු කර ඇත. මේවා අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මෝටර් රථ අළුත්වැඩියා වියදම් මෝටර් රථ ගිණුමට හර කර ඇත.

(2) සියළු ගැනුම්, ගැනුම් ජ'නල්යේ සටහන් කරයි.

(3) විකුණුම් ජ'නලයේ එකතුව විකුණුම් ගිණුමට බැර කරයි.

(4) මුදල් පොතේ දුන් වට්ටම් තීරුවේ එකතුව ණයගැති ගිණුම් වලට පමණක් බැර කරයි.

34. ලැබිය යුතු පොලී ආදායම් ගිණුම,

(1) වගකීම් ගිණුමකි. (2) වත්කම් ගිණුමකි.

(3) ආදායම් ගිණුමකි. (4) හිමිකම් ගිණුමකි.

35. ව්‍යාපාරයක ගනුදෙනු ගිණුම්ගත කිරීමේ දී ද්විත්ව කාර්යයන් ඉටු කරනු ලබන්නේ,

(1) පොදු ජ'නලය (2) ගැනුම් ජ'නලය (3) සුළු මුදල් පොත (4) විකුණුම් ජ'නලය

- ''දීසායු දෙව්මිණ'' ව්‍යාපාරයේ 2022 / 12 / 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ. එම තොරතුරු උපයෝගී කරගෙන 36 - 40 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ගිණුමේ නම	හර රු.	බැර රු.
ගැනුම්	70 000	
විකුණුම්		300 000
2022 / 01 / 01 තොගය	10 000	
ණයගැතියෝ	40 000	
ණයහිමියෝ		25 000
ලද වට්ටම්		5 000
දුන් වට්ටම්	4 000	
ඉඩම් හා ගොඩනැගිලි	1 000 000	
මෝටර් රථ	600 000	
5% බැංකු ණය		120 000
රක්ෂණ ගාස්තු	4 500	
ප්‍රචාරණ ගාස්තු	2 500	
මුදල්	48 000	
බැංකු	30 000	
ප්‍රාග්ධනය		1 359 000
	1 809 000	1 809 000

අමතර තොරතුරු :- (1) 2022 / 02 / 31 තොගය රු. 40 000 කි.

(2) 2022 / 07 / 01 දින බැංකු ණය ලබාගෙන ඇත.

(3) ප්‍රවර්තන කාලච්ඡේදයට අදාල රක්ෂණ වියදම රු. 4000 කි.

36. මෙම ව්‍යාපාරයේ 2022 / 12 / 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වනුයේ,

(1) රු. 70 000 (2) රු. 80 000 (3) රු. 10 000 (4) රු. 40 000

37. 2022 / 12 / 31 න් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වනුයේ,

(1) රු. 251, 500 (2) රු. 248, 500 (3) රු. 254, 500 (4) රු. 250, 500

38. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ දැක්විය යුතු වෙනත් වියදම් වල අගය වනුයේ,

(1) රු. 3000 (2) රු. 4000 (3) අගයක් නොමැත (4) රු. 2 500

39. දෙව්මිණ ව්‍යාපාරයේ 2022/12/31 දිනට මුළු වත්කම් වල අගය වනුයේ,

(1) රු. 1 600 000 (2) රු. 1 758 500 (3) රු. 1 758 000 (4) රු. 1 658 500

40. 2022 / 12 / 31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම වගකීම් වල අගය වනුයේ,

(1) රු. 28 500 (2) රු. 25 000 (3) රු. 3 000 (4) රු. 120 000

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 11 - 2023

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

උපදෙස්:

- **පළමු ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න 02 ක් ද, II කොටසින් ප්‍රශ්න 02 ක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

---

01. පහත සිද්ධිය ඇසුරින් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ආහාර තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදෑරූ ලලිත් ගුණරුවන් මහතා ලලි Street Food නමින් කුරුණෑගල නගරයේ ජනාකීර්ණ වීදියක ආහාර සකස් කර විකිණීමේ ව්‍යාපාරයක් 2023 / 01 /01 දින ආරම්භ කරන ලදී. රජයේ කාර්යාල රැසක් එම වීදියේ පිහිටා තිබීමත් එම කාර්යාල වල ආපන ශාලා වලට ද ආහාර සකස් කර බෙදා හැරීමට හැකි වීම නිසා ඔහුගේ ව්‍යාපාරයට සාර්ථක ව්‍යාපාරයක් බවට පත්විය. ඒ සඳහා ඔහු ආහාර සකස් කිරීම පිළිබඳ විශේෂ නිපුනතාවයක් දක්වන සූපවේදියෙක් බඳවා ගන්නා ලදී. පරණ ලොරි රථයක් මිලදී ගෙන එය අලංකාර ලෙස සකස් කර එතුල ආහාර සකසන ලදී. අත් පත්‍රිකා මුද්‍රණය කොට රජයේ කාර්යාල වලට සහ පාසල් වලට බෙදා හරින ලදී. ලලිත් ගුණරුවන් මහතා සෑම විටම ඉතා ඉහළ ගුණත්වයෙන් යුතුව ආහාර සකස් වන්නේ ද පිළිබඳ සොයා බැලීය. ඊළඟ මාසයේ දී මංගත (online) ක්‍රමයට ඇණවුම් ලබා ගෙන ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමට තීරණය කරන ලදී.

2023 ජනවාරි මාසයේ මුදල් පොත පහත දැක්වේ.

මුදල් පොත

දිනය	ලඅ	විස්තරය	සපි	වටිනාකම	දිනය	වඅ	විස්තරය	සපි	වටිනාකම
2023					2023				
1/1	01	ප්‍රාග්ධන ගිණුම		300 000	1/2	01	ලොරි රථ ගිණුම		700 000
1/1	02	බැංකු ණය ගිණුම		800 000	1/3	02	උපකරණ ගිණුම		200 000
1/30	03	විකුණුම් ගිණුම		120 000	1/4	03	ගැනුම් ගිණුම		50 000
					1/10	04	ඉන්ධන ගිණුම		5 000
					1/10	05	අත් පත්‍රිකා ගිණුම		2 500
					1/15	06	වාහන අලුත්වැඩියා		10 000
					1/25	07	වැටුප් ගිණුම		25 000
					1/31		ශේෂය ප/ගෙ		227 500
				1 220 000					1 220 000
		ශේෂය ඉ/ගෙ		227 500					

අතිරේක තොරතුරුඃ

ණයට ගැනුම් 10 000

ණයට විකුණුම් 30 000

බැංකු ණය පොලිය 6% ණය පොලිය උපචිතව ඇත.

මෝටර් රථ ක්ෂය 12%

(i) (අ) ''ලලි Street food '' ව්‍යාපාරයේ නිෂ්පාදනය කරනු ලබන පහත නිෂ්පාදිත වල ඒවායේ සර්වභාය අනුව කුමන ව්‍යාපාර වර්ග වලට අයත් වේද?

(1) සකස් කළ ආහාර (2) සකස් කළ ආහාර විකිණීම.

(ආ) ''ලලි Street food '''' ව්‍යාපාරයේ ශක්තීන් හා අවස්ථා වලට උදාහරණය බැගින් දක්වන්න.

(ii) ''ලලි Street food '' ව්‍යාපාරයේ ඇල්මැති පර්ශව 02 නම් කර ව්‍යාපාරය ඔවුන් කෙරෙහි ඇල්මක් දැක්වීමට හේතුව බැගින් නම් කරන්න.

(iii) (අ) ''ලලි Street food '' ව්‍යාපාර සංවිධානය පහත නිර්නායක යටතේ වර්ග කර දක්වන්න.

(1) හිමිකාරිත්වය අනුව - (2) අරමුණු අනුව -

(ආ) මෙම ව්‍යාපාරයේ සිල්ලර වෙළෙඳාමට සහ තොග වෙළෙඳාමට සිද්ධියෙන් උදාහරණය බැගින් නම් කරන්න.

(iv) පහත සඳහන් කාර්යයන් වලට අදාල කළමනාකරණ කාර්යයන් සහ අලෙවිකරණයේ විචල්‍යයන් සඳහන් කරන්න.

(1) ඉහළ ගුණත්වයෙන් යුතු ආහාර නිෂ්පාදනය කර ඇත් දැයි සොයා බැලීම.

(2) සේවකයන් බඳවා ගැනීම.

(3) මංගත ක්‍රමයට බෙදා හැරීම.

(4) අත් පත්‍රිකා බෙදා හැරීම.

(v) 2023 /01/01 දිනට සිදු වූ ගනුදෙනු මුදල් පොතෙන් උපුටාගෙන ගිණුම්කරණ සමීකරණයේ දක්වන්න.

(vi) ව්‍යාපාරයට අදාල මූලික පොත් 02 සහ මූලාශ්‍ර ලේඛන 02 දක්වන්න.

(vii) (අ) 2023/01/31 දිනෙන් අවසන් මාසයට අදාල ක්ෂය ප්‍රමාණය ගණනය කරන්න.

(ආ) මාසයට අදාල ක්ෂය ප්‍රමාණය වාර්තා කිරීමට අදාල ජ'නල් සටහන (ද්විත්ව සටහන) වටිනාකම් සහිතව දක්වන්න.

(viii) මෙම ව්‍යාපාරය 2023/01/31 දිනට ණය පොලිය ගෙවා නැත. උපචිත ණය පොලිය ගිණුම් ගත කරන්න.

(ix) ''ලලි Street food '' ව්‍යාපාරයේ 2023/02/31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

(x) 2023 / 01 / 31 දිනට මුළු හිමිකම ගණනය කරන්න. (ල. 2 x 10 = 20)

02. (i) (අ) භාණ්ඩයක් යනු කුමක් ද? (ල. 01)

(ආ) නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනය යනු කුමක් ද? (ල. 01)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) අවශ්‍යතා සංඛ්‍යාත්මකව ඉතා වැඩි ප්‍රමාණයක් පවතී.

(ආ) ව්‍යාපාර කටුතු මෙහෙය වන්නේ කළමණාකරුවෝය.

(ඉ) නවීන තාක්ෂණය ලබාගත හැකි වීම. ගෝලීයකරණයේ වාසියකි.

(ඊ) නව තාක්ෂණ ක්‍රම සඳහා අනුගත වීම දුෂ්කරවීම ව්‍යාපාරයට ඇති තර්ජනයකි. (ල. 02)

(iii) අ.පො.ස. (උ.පෙළ) වාණිජ විෂයධාරාව හැදෑරූ සහන්ට විශ්ව විද්‍යාල වරම් අහිමි වුවද ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාවක් හදාරන ලදී.

තම නිවස දිය ඇල්ලක් අසල පිහිටා තිබෙන නිසා එම ජලය පිරිපහදු කර පානීය ජල බෝතල් සකස් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

(අ) මෙම ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් අවශ්‍යතාවහා වුවමනාව කුමක් ද?

(ආ) නිෂ්පාදන සාධකයක් නම් කර ඉහත සිද්ධිය ඇසුරින් නිදසුනක් ලියන්න. (ල. 02)

(iv) ඉන්දියාවෙන් බිත්තර ආනයනය කිරීමත් සමඟ දේශීය බිත්තර මිල දී පහළ වැටුනි.

(අ) ඉහත සිද්ධියට අදාල වන පරිසර සාධක 02 ක් ලියන්න.

(ආ) බිත්තර අලෙවි කරන ආයතන නිෂ්පාදිතයේ ස්වාභාවය අනුව කිනම් ව්‍යාපාර වර්ගයට අයත් වේද? (ල. 02) (මුළු ලකුණු 08)

03. (i) (අ) හවුල් ව්‍යාපාරයක් යනු කුමක් ද?

(ආ) හවුල් ව්‍යාපාරයක ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සේවක සංඛ්‍යාව පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ ප්‍රමාණාත්මක නිර්ණායකයෙකි.

(ආ) තනි පුද්ගල ව්‍යාපාරයක් ගිවිසුම් වලට එළඹීමේ දී ව්‍යාපාරය නමින් සිදු කළ යුතුයි.

(ඉ) රාජ්‍ය සංස්ථා උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරයි.

(ඊ) තනිපුද්ගල ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් නෛතික පුද්ගලභාවයක් හිමි වේ. (ල. 02)

(iii) ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය මගින් විදුලි ගාස්තු ඉහළ දැමීම නිසා සියළුම විදුලි පාරිභෝගිකයන් දැඩි අපහසුතාවයකට පත් වී ඇත.

(අ) ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය අයිති ව්‍යාපාර සංවිධානය කුමක් ද?

(ආ) එම ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියක් හා අවාසියක් ලියන්න. (ල. 02)

(iv) (අ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු 02 ක් ලියන්න.

(ආ) යෝග්‍ය ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගනු ලබන සාධක 02 ක් ලියන්න.

(මුළු ලකුණු 08)

04. (i) (අ) තොග වෙළඳාම යනු කුමක් ද?

(ආ) ස්ථාවර මහා පරිමාණ සිල්ලර වෙළෙඳසැල් සඳහා නිදසුනක් ලියන්න. (ල. 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) උපකාරක සේවා සහ වෙළෙඳාම අතර අන්‍යෝන්‍ය රැඳියාමක් පවතී.

(ආ) ඉතුරුම් ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යෑමෙන් මුදලට ආරක්ෂිත බවක් ලැබේ.

(ඉ) හානි පූර්ණය මූලධර්මය ජීවිත හා දේපළ රක්ෂණ දෙකටම අදාළ වේ.

(ඊ) දුරකථන සංවාද විද්‍යුත් හා වාචික යන මාධ්‍ය දෙකටම අදාළ වේ. (ල. 02)

(iii) අධික වියළි කාලගුණික තත්ත්වය නිසා මේ දිනවල වැව්වල ජලය අඩු වී යාම හේතුවෙන් වැව්වල මත්ස්‍යයන් අල්ලා ගම්වල ගොවි සමිති හරහා ගමේ මාළු පරිභෝජනය කරන්නන්ට සහ ප්‍රදේශයේ මාළු අලෙවි කරන වෙළෙන්දන්ට අලෙවි කරයි.

(අ) මෙහි සිදුවන තොග හා සිල්ලර වෙළඳාමට නිදසුන් එක බැගින් ලියන්න.

(ආ) මාළු ප්‍රවාහනය සඳහා සුදුසු ප්‍රවාහන මාධ්‍ය කුමක් ද? (ල. 02)

(iv) දහම් පෙරේරා යන අය සහල් අලෙවි සැලක් පවත්වාගෙන යයි. ප්‍රදේශයේ වල් අලි බහුලව සිටින නිසා ඔහු එම ව්‍යාපාරය රක්ෂණය කර තිබේ. එමෙන්ම ඔහු තම ගනුදෙනු පහසු කර ගැනීම සඳහා ජංගම ගිණුමක් ලංකා බැංකුවේ පවත්වාගෙන යයි.

(අ) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි 02 ක් ලියන්න.

(ආ) ජීවිත රක්ෂණය සහ දේපළ රක්ෂණය අතර වෙනස් කමක් ලියන්න. (ල. 02)

(මුළු ලකුණු 08)

II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) ගිණුම්කරණයේ මූලික අරමුණ සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාරයේ වත්කමක දැකිය හැකි ලක්ෂණ 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) (අ) ගැනුම් ගිණුම හර 15 000

ණය හිමි ගිණුම බැර 15 000

ඉහත දැක් වූයේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවකට අදාල ජ'නල සටහනයි. එම ගනුදෙනුව ලියන්න.

(ආ) රු. 80 000 ක භාණ්ඩ කමල්ගෙන් ණයට ගැනීමට අදාල ජ'නල් සටහන ලියා දක්වන්න.(ල.02)

(iii) දමිත් විසින් 2023 / 01/01 දින රු. 50 000 ක් යොදා ආරම්භ කළ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදුවිය.

(1) රු. 40 000 ක භාණ්ඩ ණයට ගැනීම.

(2) රු. 10 000 ක විදුලි බිල්පත් ගෙවීම.

(3) රු. 20 000 ක භාණ්ඩ 25 000 කට විකිණීම.

(4) අයිතිකරු රු. 15 000 ක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.

(අ) ඉහත ගනුදෙනු වත්කම් = වගකීම් + හිමිකම යන සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (ල. 02)

	වත්කම් 50 000	= වගකීම් =	+ හිමිකම 50 000
(i)			
(ii)			
(iii)			
(iv)			

(ආ) 2023 / 01 / 31 දිනට ව්‍යාපාරයේ වත්කම් වල හා හිමිකමෙහි අගයන් දක්වන්න. (ල. 02)

(iv) තුෂාරගේ ව්‍යාපාරයේ 2023 අගෝස්තු මාසයේ පහත ගනුදෙනු සිදුවිය.

08 / 02 දින රු. 50 000 ක භාණ්ඩ කමල්ට ණයට විකිණීම.

08/15 දින රු. 30 000 ක භාණ්ඩ නිමල්ට ණයට විකිණීම.

08/23 දින රු. 15 000 ක භාණ්ඩ නුවන්ට ණයට විකිණීම.

08/30 දින රු. 35 000 ක භාණ්ඩ නිමල්ට ණයට විකිණීම.

අවශ්‍ය වන්නේ,

(අ) 2023 අගෝස්තු මාසයේ සිදු වූ ගනුදෙනු විකුණුම් ජ'නලයේ සටහන් කරන්න. (ල. 02)

(ආ) එම ගනුදෙනු අදාල ලෙජර් ගිණුම් වලට පිටපත් කරන්න. (ල. 02)

(මුළු ලකුණු 12)

06. (i) 2023 /01/01 දින රමේෂ්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් භාරකරු සතුව රු. 2100 ක් තිබුණි. එදින ප්‍රධාන මුදල් භාරකරු සුළු මුදල් භාරකරු තම රු. 7 900 ක් ලබා දුන්නේ නම්,

(අ) ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය කොපමණ ද? (ල. 01)

(ආ) පෙර මාසයේ සුළු මුදලින් කළ ගෙවීම් වල වටිනාකම කොපමණ ද? (ල. 01)

(ii) (අ) වර්තමානයේ භාවිතා කරනු ලබන පරිගණක මෘදුකාංග 02 ක් සඳහන් කරන්න. (ල. 01)

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය යනු කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 01)

(iii) ලංකා ව්‍යාපාරයේ 2023 අගෝස්තු මාසයේ පිළියෙල කළ බැංකු ගිණුමේ ශේෂය රු. 28 000 ක් වන අතර බැංකු ප්‍රකාශයේ ශේෂය වෙනත් අගයක් ගන්නා ලදී. වෙනසට පහත කරුණු බලපෑ ඇත.

- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත 6 000 කි.
- නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් 8 000 කි.
- බැංකුව අයකල ගාස්තු 3 000 කි.
- ස්ථාවර නියෝග මත ගෙවීම් 7 000 කි.
- ණයගැති ප්‍රේෂණ 4 000 කි.

අවශ්‍ය වන්නේ,

(අ) සංශෝධිත බැංකු ගිණුම

(ආ) අගෝස්තු මාසය සඳහා බැංකු සැසඳුම් විසතරය (ල. 04)

(iv) සුමුදුගේ ව්‍යාපාරයේ 2022 / 12 / 31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම අසමාන වූ අතර වෙනසට පහත හේතු බලපෑ ඇත.

- රු. 8 000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් පොත් වලින් මග හැර තිබීම.
- රු. 5 000 ගොඩ නැගිලි කුලී ගෙවීම එම ගිණුමේ සටහන් නොවීම.
- රු. 5 000 යන්ත්‍ර මිලදී ගැනීම යන්ත්‍ර අළුත්වැඩියා ගිණුමේ සටහන් කර ඇත.
- රු. 2 000 ක පොලි ආදායම් දෙවරක් පොලී ආදායම් ගිණුමේ සටහන් වී ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න.

(ආ) වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්. (ල. 04)

(මුළු ලකුණු 12)

07. (i) (අ) ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය සහ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කිරීම සඳහා පිළියෙල කරන ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන 02 නම් කරන්න. (ල. 01)

(ආ) උපචිත රක්‍ෂණ ගාස්තු රු. 6 500 ගිණුම්ගත කිරීමේ ජ'නල් සටහන ලියා දක්වන්න. (ල. 01)

(ii) (අ) ශේෂ පිරික්ෂුමක් තුළ හඳුනාගත හැකි ලෙජර් ගිණුම් 02 ක් නම් කරන්න. (ල .01)

(ආ) ව්‍යාපාරය සතු වත්කමක දැකිය හැකි ලක්‍ෂණ 02 ක් ලියන්න. (ල. 01)

(iii) ධරණිගේ ව්‍යාපාරයේ 2022 / 12 / 31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

2022 /01/01 තොගය	11 000	
ගැනුම්	120 000	
විකුණුම්		250 000
ප්‍රාග්ධනය		250 000
ලද වට්ටම්		6 000
දුන් වට්ටම්	8 000	
5% ආයෝජන	100 000	
10% බැංකු ණය		200 000
විදුලිය	10 000	
රක්ෂණය	6 000	
ගෙවූ ණය පොලී	2 000	
ණයගැතියෝ	48 000	
ණය හිමියෝ		44 000
මුදල්	95 000	
මෝටර් රථ - පිරිවැයට	250 000	
පරිගණක - පිරිවැයට	100 000	
	750 000	750 000

අමතර තොරතුරු:-

(1) 2022 / 12 /31 දිනට තොගය රු. 30 000 කි.

(2) 2022 / 12 /31 දිනට බැංකු ණය පොලී හා ආයෝජන පොලී ආදායම් උපචිතව ඇත.

(3) ණයගැතියන්ගෙන් රු. 8 000 ක් බොල්ණය ලෙස කපා හැරිය යුතුය.

අවශ්‍ය වන්නේ,

(1) ධරණිගේ ව්‍යාපාරයේ 2022 / 12 / 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය.

(ලකුණු 04)

(2) ධරණිගේ ව්‍යාපාරයේ 2022/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04)

(මුළු ලකුණු 12)

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(2)	2 -(4)	3 -(1)	4 -(4)	5 -(3)	6 -(1)	7 -(4)	8 -(3)	9 -(2)	10 -(2)
11-(3)	12 -(4)	13 -(2)	14 -(3)	15 -(3)	16 -(1)	17 -(2)	18 -(1)	19 -(2)	20 -(3)
21-(3)	22 -(4)	23 -(1)	24 -(4)	25 -(3)	26 -(4)	27 -(1)	28 -(2)	29 -(2)	30 -(4)
31-(4)	32 -(1)	33 -(3)	34 -(2)	35 -(3)	36 -(4)	37 -(4)	38 -(3)	39 -(3)	40 -(1)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

II පත්‍රය - I කොටස

01. (i) (අ) (1) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර

(2) සේවා නිෂ්පාදන ව්‍යාපාර (ල. 1/2 x 2 = 1)

(ආ) ශක්තීන් -

- ආහාර තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක් හදාර තිබීම.
- නිපුණතාවයක් සහිත සූපවේදියෙක් සිටීම.

අවස්ථා

ජනාකීර්ණ විදියක ආරම්භ කිරීම.

අවට රජයේ කාර්යාල තිබීම. (කරුණු 2 x 1/2 = 01)

(ii) අයිතිකරු - ලලිත් රුවන් මහතා

ප්‍රමාණවත් ප්‍රාග්ධන දායකත්වය ලබා ගැනීම / ව්‍යාපාරයේ කටයුතු සුපරීක්ෂණය

සේවකයා - සූපවේදියා

පවරන ලද කාර්ය නිසි පරිදි ඉටු කර ගැනීම / ශ්‍රම ඵලදායිතාව වර්ධනය

පාරිභෝගිකයා / කාර්යාල සේවකයෝ - ගුණත්වයෙන් උසස් භාණ්ඩ මිලදී ගැනීම.

ආපනශාලා හිමියෝ - කලට වේලාවට නිෂ්පාදන ලබා ගැනීම.

(ඇල්මැති පාර්ශව 02 ක් නම් කිරීමට ලකුණු 01 හේතු දැක්වීම ලකුණු 01)

(iii) හිමිකාරිත්වය අනුව - පෞද්ගලික

තනිපුද්ගල ව්‍යාපාර

02. අරමුණු අනුව - ලාභ අරමුණු කර ගත (1/2 x 2 = ලකුණු 01)

(ආ) සිල්ලර වෙළඳාම - ගනුදෙනු කරුවන්ට ආහාර නිෂ්පාදනය කර අලෙවි කිරීම.

තොග වෙළඳාම - ආපන ශාලා වලට නිෂ්පාදිත අලෙවි කිරීම. (ල. 1/2 x 2 = 01)

(iii) (1) පාලනය

(2) සංවිධානකරණය

(3) ස්ථානය / බෙදා හැරීම / සැලසුම්කරණය

(4) ප්‍රවර්ධනය / ප්‍රචාරණය. (ල. 1/2 x 4 = 02)

වත්කම්	=	හිමිකම්	+	වගකීම්	
මුදල් + 200 000		ප්‍රාග්ධනය + 200 000			(ල. 01)
මුදල් + 800 000			+	බැංකු ණය + 800 000	(ල. 02)
1 000 000	=	+ 200 000		+ 80 000	(ල. 02)

(iv) මුදල් පොත — ලදුපත, ගෙවීම් වවුචරය

ගැණුම් ජ'නලය — ගැනුම් ඉන්වොයිසිය

විකුණුම් ජ'නලය — විකුණුම් ඉන්වොයිසිය (මූලික පොත් 02 ල. 01 මූලාශ්‍ර ලේඛන 02 x 01)

(vii) (අ) $700\,000 \times \frac{12}{100} \times \frac{1}{12}$ ලකුණු 1/2

රු. 7 000 ලකුණු 1/2

(ආ) ලොරි රථ ක්ෂය ගිණුම හර 7 000

ලොරි රථ ක්ෂය වෙන් කිරීමේ ගිණුම 7 000 (ල. 01)

(iii)

ණය පොලී ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම	දිනය	විස්තරය	ස පි	වටිනාකම
2023/12/31	උපචිතණය පොලීගිණුම		4 000				

උපචිත ණය පොලී ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම	දිනය	විස්තරය	ස පි	වටිනාකම
				2023/12/31	ණය පොලී ගිණුම		4 000

(වටිනාකම් නිවැරදි නැතත් නිවැරදිව ගිණුම් ගත කර ඇත්නම් ල. 02)

(ix) 2023/01/31 දිනට ආදායම් ප්‍රකාශය

	ආදායම්		
ල. 1/2	අත්පිට විකුණුම්	120 000	
	ණයට විකුණුම්	30 000	150 000
	වියදම්		
ල. 1/2	අත්පිට ගැනුම්	50 000	
	ණයට ගැනුම්	10 000	
	ඉන්ධන	5 000	
ල. 1/2	අත් පත්‍රිකා	2 500	
	වැටුප්	25 000	
	අළුත් වැඩියා	10 000	
ල. 1/2	ලොරි රථ ක්ෂය	7 000	
	විදුලිය	4 000	113 500
	ශුද්ධ ලාභය		36 500

(x) 2023/01/01 හිමිකම 200 000

2023/01/31 ශුද්ධ ලාභය + 36 500

2023/01/31 හිමිකම 236 500 (ල. 02)

01/01 හිමිකමට ශුද්ධ ලාභය එකතු කර ඇත්නම් වටිනාකම වැරදුනත් ල. 01 පවරන්න)

02. (i) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා ස්පර්ශ කළ හැකි භෞතික පැවැත්මක් ඇති ද, භාණ්ඩ ලෙස හඳුන්වයි. (ල. 01)

(ආ) නිෂ්පාදනයේ දී ආධාර කරගන්නා මිනිසා විසින් සකස් කරන ලද දෑ ප්‍රාග්ධනය ලෙස හඳුන්වයි.(ල. 01)

(ii) (අ) අසත්‍යයයි (ඉ) සත්‍යයයි

(ආ) සත්‍යයයි (ඊ) සත්‍යයයි (ල. 1/2 x 4 = 02)

(iii) (අ) අවශ්‍යතාව - ආහාර (ල. 1/2)
වුවමනාව - ජලය (ල. 1/2)
(ආ) භූමිය - ජලය නිෂ්පාදන සාධකය - ල. 1/2
ප්‍රාග්ධනය - බෝතල් නිදසුන - ල. 1/2
(iv) (අ) ගෝලීය පරිසරය, ආර්ථික පරිසරය (ල. 1/2 x 2 = 01)
(ආ) සේවා සැපයීමේ ව්‍යාපාරයකි. (ල. 01)

03. (i) (අ) ලාභ ලැබීමේ අරමුණින් පොදුවේ පවත්වාගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාව හවුල් ව්‍යාපාරයක් ලෙස හැඳින්විය හැකි ය.
(ආ) ⋆ සාමාජික සංඛ්‍යාව අවම 02 ක් සහ උපරිම 20 ක් වීම. ⋆ හවුල් ගිවිසුමක් තිබිය යුතුයි.
⋆ හවුල්කරුවන් ගේ වගකීම අසීමිත වීම. ⋆ හවුල් ව්‍යාපාර ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
⋆ නෛතික පුද්ගලභාවයක් නොමැති වීම. ⋆ අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
(ඕනෑම කරුණු 02 ට 1/2 x 2 = 01)
(ii) (අ) සත්‍යයයි. (ආ) සත්‍යයයි. (ඉ) සත්‍යයයි. (ඊ) අසත්‍යයයි. (ල. 1/2x 4 =02)
(iii) (අ) රාජ්‍ය සංස්ථා (ල. 01)
(ආ) වාසි:- ● අනවශ්‍ය සේවා සම්පාදනය සඳහා උචිතවීම. ● පෞද්ගලික අංශයේ ඒකාධිකාරී බලපෑම අවම කිරීමට දායක වීම. ● ලාභය මහජනතාව සතු වීම.
අවාසි:- ⋆ තීරණ ගැනීමේ ස්වාධීන තත්ත්වය නැති වීම. ⋆ රජයේ මූල්‍ය රෙගුලාසි වලට යටත් වීම.
(ඕනෑම වාසි එකක් සහ අවාසි එකකට ල. 1/2 බැගින් = 01)
(iv) (අ) ● අයිතිකරුගේ මූල්‍ය ශක්තිය ● කුසලතා හා පළපුරුද්ද. ● විවිධ සබඳතා ● නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය. ● නිෂ්පාදනයට අදාල වෙළඳපොල කොටස.
(ඕනෑම කරුණු 02 ට 1/2 x 2 = 01)
(ආ) ● අරමුණ අනුව. ● පරිමාණය අනුව ● කළමනාකරණ කටයුතු සිදු කරනුයේ කවුරුන්ද යන්න අනුව.
(ඕනෑම කරුණු 2 කට 1/2 x 2 = 01)

04. (i) (අ) නැවත විකිණීමේ අරමුණින් නිෂ්පාදිත මිළට ගැනීම තොග වෙළෙඳාමකි. (ල. 01)
(ආ) සුපිරි වෙළඳසල් (ල. 01)
(ii) (අ) සත්‍යයයි. (ආ) සත්‍යයයි. (ඉ) අසත්‍යයයි. (ඊ) සත්‍යයයි. (ල. 1/2 x 4 = 02)
(iii) (අ) සිල්ලර වෙළෙඳාම - ගොවි සමිතිය මගින් මාළු පරිභෝජනය කරන්නන් මාළු මිලදී ගැනීම. / විකිණීම. (ල. 1/2)
තොග වෙළඳාම - ගොවි සමිති මගින් අදේශයේ මාළු අලෙවි කරන වෙළෙන්දන් මිලදී ගැනීම. (ල. 1/2)
(ආ) ලොරි රථ / ශීතාගාර සහිත පළාරි රථ (ල. 01)
(iv) (අ) ● චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකි වීම. ● බැංකු අයිරා පහසුකම් ලබා ගත හැකි වීම. ● සෘජු ප්‍රේෂණ රැස් කිරීම. ● ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම. ● බැංකු ප්‍රකාශය ලැබීම.
(ඕනෑම කරුණු 02 ට ල. 1/2 x 2 = 01)
(ආ)

ජීවිත රක්ෂණය :-	දේපළ රක්ෂණය
● පුද්ගලයාගේ කැමැත්ත හා ආදායම මත ඔප්පුවේ වටිනාකම තීරණය වීම.	⋆ ඔප්පුවේ වටිනාකමට දේපල වටිනාකම මත තීරණය වේ.
● හානිපූරණ මූලධර්මය අදාළ නොවේ.	⋆ හානි පූර්ණ මූලධර්මය අදාල වේ.
● අමතර ප්‍රතිලාභ ලැබේ.	⋆ අමතර ප්‍රතිලාභ නොලැබේ.
● ඔප්පුව පැවරිය නොහැක.	⋆ ඔප්පුව පැවරිය හැක.

(ඕනෑම ගැලපෙන කරුණු 02 ට ල.01)

II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශවවලට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම. (ල. 01)

(ආ) අතීත ගනුදෙනු මත ප්‍රතිඵලයක් ලෙස ඇතිවිට, ව්‍යාපාරයට පාලනය කළ හැකි වීම. (ල. 01)

(ii) (අ) රු. 15 000 ක භාණ්ඩ ණයට විකිණීම. (ල. 01)

(ආ) ගැනුම් ගිණුම හර 80 000

තොග හිමි / කමල්ගේ ගිණුම බැර 80 000 (ල. 01)

(iii)

	වත්කම්	= වගකීම්	+ හිමිකම
	50 000		50 000
(1)	40 000 භාණ්ඩ තොගය	40 000 ණය හිමියන්	
(2)	(10 000) මුදල්		(10 000) විදුලි බිල
(3)	(20 000) භාණ්ඩ තොගය 25 000 මුදල්		 5 000 ලාභය
(4)	(15 000) මුදල්		(15 000) ගැනිලි

(2)–(4): ල. 02

(ආ) වත්කම් = 70 000 (ල. 01) හිමිකම් = 300 000 (ල. 01)

(iv)

දිනය	ඉ/අ	ගැනුම් කරු	වටිනාකම
8/02		කමල්	50 000
8/15		නිමල්	30 000
8/23		නුවන්	15 000
8/30		නිමල්	35 000
		ගැණුම් ගිණුමට පිටපත් කළා	130 000

ල. 02

විකුණුම් ගිණුම

	කමල් 50 000
	නිමල් 30 000
	නුවන් 15 000
	නිමල් 35 000

කමල්

විකුණුම් 50 000	

නුවන්

විකුණුම් 15 000	

නිමල්

විකුණුම් 30 000	
විකුණුම් 35 000	

(ල. 02)

06. (i) (අ) රු. 10 000 (ල. 01) (ආ) 7 900 (ල. 01)

(ii) (අ) ඕනෑම පිළිතුරු 2 කට (ල. 01) (ආ) නිවැරදි පිළිතුරට ලකුණු 01 යි.

(iii) **සංශෝධිත බැංකු ගිණුම**

ඉ/ගෙ	28 000 ල. 1/2	බැංකු ගාස්තු	3 000 ල. 1/2
ප්‍රේෂණ	4 000 ල. 1/2	ස්ථාවර නියෝග	7 000 ල. 1/2
		ප/ගෙ	22 000
	32 000		32 000

බැංකු සැසඳුම් ප්‍රකාශය

සංශෝධිත බැංකු ගිණුමට අනුව ශේෂය		22 000	(½)
(+) ඉදිරිපත් නොවූ චෙක්	8 000	8 000	(½)
		30 000	
(-) උප ලබ්ධි නොවූ චෙක්	6 000	6 000	(½)
බැංකු ප්‍රකාශයට අනුව පොදු		24 000	(½)

(ල. 2)

අවිනිශ්චිත ගිණුම

7 000 (01)	ගැනිලි 5 000 පො. අ. 2 000 (01)
7 000	7 000

පොදු ජ'නලය

ණයලගැති ගිණුම හර විකුණුම් ගිණුම බැර (සංලක්ෂ්‍යය)	8 000	8 000
ගොඩනැගිලි කුලී හර ආ/ගිණුම බැර (සංලක්ෂ්‍යය)	5 000	5 000
යන්ත්‍ර ගිනුම හර යන්ත්‍ර අළුත්වැඩියා වියදම් ගිණුම (සංලක්ෂ්‍යය)	5 000	5 000
පොලී ආදායම් අ/ගිණුම බැර (සංලක්ෂ්‍යය)	2 000	2 000

(ල. 02)

07. (i) (අ) • ලාභ හෝ'අලාභ ප්‍රකාශනය • මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (එකකට 1/2 බැගින් ල. 01)

(ආ) රක්‍ෂණ ගාස්තු ගිණුම රු. 6 500

උපචිත රක්‍ෂණ ගාස්තු රු. 6 500 (ල. 01)

(ii) (අ) වත්කම් ගිණුම

වගකීම් ගිණුම

හිමිකම් ගිණුම

ආදායම් ගිණුම

වියදම් ගිණුම (කුමන හෝ ගිණුම් 02 ක් ඇත්නම් ල. 01)

(ආ) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම

ව්‍යාපාරයේ පාලනයට යටත් වීම

අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම. (කුමන හෝ පිළිතුරු 02 කට ල. 01)

(iii) ධරනීගේ ව්‍යාපාරයේ 2022 / 12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ල. 1/2)

විකුණුම්				250 000	
(-) විකුණුම් පිරිවැය					
ආරම්භක තොගය			11 000		
+ ගැනුම්			120 000		
			131 000		
		(½)	(30 000)	(101 000)	
(-) අවසන් තොගය				149 000	(½)
දල ලාභය					
වෙනත් ආදායම්					
ආයෝජන ආදායම්			5 000		
ලද වට්ටම්		(½)	6 000	11 000	
				160 000	
බෙදාහැරීමේ වියදම්					
බොල් ණය	(½)	8 000			
දුන් වට්ටම්		8 000	16 000		
පරිපාලන වියදම්					
විදුලිය		10 000			
රක්ෂණය	(½)	6 000	16 000		
වෙනත් වියදම්					
මූල්‍ය වියදම්					
ණයපොලී	(½)	20 000	20 000	52 000	
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා.			(½)	108 000	

(ල. 04)

(2) ධරණීගේ ව්‍යාපාරයේ 2022/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (½)

ජංගම නොවන වත්කම්		
මෝටර් රථ		250 000
පරිගණක		100 000
		350 000
5% ආයෝජන		100 000
	(½)	450 000
<u>ජංගම වත්කම්</u>		
අවසන් තොගය	8 000	
ණයගැතියෝ (½)	40 000	
ලැබිය යුතු ආයෝජන ආදායම්	5 000	
මුදල් (½)	95 000	170 000
මුළු වත්කම්		620 000
ප්‍රාග්ධනය (½)	250 000	
+ ශුද්ධ ලාභය	108 000	358 000
<u>ජංගම නොවන වගකීම්</u>		
10% බැංකු ණය	(½)	200 000
<u>ජංගම වගකීම්</u>		
ණයහිමියෝ	44 000	
උපචිත ණය පොලී (½)	18 000	62 000
මුළු හිමිකම සහ වගකීම්		620 000

(ල. 04)